# Holiday Assignments

**ADVANCE LEVEL III**

**Subject: Political Science** **Grade 12** **Medium: Sinhala**

12 ශ්‍රේණිය

ප්‍රශ්න පත්‍ර අංක 04

❖ **පහත ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සපයන්න.**

01. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය පැතිකඩ කිහිපයකින් හඳුනාගත හැකි වේ. ඉන් දෙකක් නම් කරන්න.

i..........................................................

ii..........................................................

02. ආණ්ඩුකරණය (Governance) යනු දේශපාලන විද්‍යා අධ්‍යාපනයේ ප්‍රධාන පැතිකඩකි. ආණ්ඩුකරණ ක්‍රියාවලියට අයත් කාර්යයන් දෙකක් නම් කරන්න.

i..........................................................

ii..........................................................

03. දාර්ශනික ප්‍රතීයමාන ප්‍රවේශය (Philosophical Normative Approach) මූලික ලක්ෂණ ත්‍රිත්වයකින් යුක්ත වේ. ඉන් දෙකක් සඳහන් කරන්න.

i..........................................................

ii..........................................................

04. දේශපාලන අර්ථ ශාස්ත්‍රිය ප්‍රවේශයේ (Political Economy Approach) පුරෝගාමී චින්තකයන් දෙදෙනෙකු නම් කරන්න.

i..........................................................

ii..........................................................

05. දේශපාලනය අධ්‍යයනය සඳහා වූ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ (Comparative Approach) ප්‍රධාන ධාරවන් තුනකි. ඉන් දෙකක් නම් කරන්න.

i…………………………………………………………

ii…………………………………………………………

06. දේශපාලන න්‍යාය (Political theory) යන සංකල්පයට අර්ථ දෙකක් තිබේ. ඒ මොනවාද?

i…………………………………………………………

ii…………………………………………………………

07. පහත දැක්වෙන ලක්ෂණ අදාළ වන ආණ්ඩුක්‍රම පිළිවෙලින් නම් කරන්න.

1. පරම්පරාවෙන් රාජ්‍යයත්වයට උරුමකම් කියන තනි පුද්ගල පාලනයකි. ....................................................

2. මහජන නියෝජිතයින් මගින් ගෙනයනු ලබන පාලන ක්‍රමයකි...........................................

08. නූතන භෞමික රාජ්‍ය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධානගත කොට තිබේ. ඉන් 02ක් නම් කරන්න.

i…………………………………………………………

ii…………………………………………………………

09. රාජ්‍ය සතු ස්වාධිපත්‍ය බලය පැතිකඩ දෙකකින් යුක්ත වේ. එම ද්විත්වය දක්වන්න.

i…………………………………………………………

ii…………………………………………………………

10. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍යය මූලික සමාජ දේශපාලන විචල්‍යයන් 02ක් සඳහන් කරන්න.

i…………………………………………………………

ii…………………………………………………………

11. රාජ්‍යයේ සම්භවය පිළිබඳව සමාජ සම්මුති න්‍යායයක් (Social Contact theory) ඉදිරිපත් කළ රූසෝගේ ප්‍රවාදයෙන් ප්‍රකාශ වූ මූලධර්ම දෙක මොනවාද?

i…………………………………………………………

ii…………………………………………………………

12. ජාතිකවාදී මතවාදය (Nationalism) ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගනී. ඉන් දෙකක් නම් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

13. ලිබරල් නිරාගමිකවාදය (Liberal Secularism) විසින් අනාවරණය කරන මූලධර්ම ද්විත්වයක් දක්වන්න.

i……………………………………………………………

ii……………………………………………………………

14. දේශපාලන මතවාදයක් ලෙස ස්ත්‍රීවාදයේ (Feminism) ප්‍රධාන ධාරාවන් කිහිපයක් පවතී. ඉන් දෙකක් නම් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

15. සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවාගැනීමට මුල්වන හේතූන් දෙකක් සඳහන් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

16. ඓතිහාසික වශයෙන් සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවාගත් මාර්ග තුනක් පවතී. ඉන් දෙකක් සඳහන් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

17. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ දෙකක් දක්වන්න.

i……………………………………………………………

ii……………………………………………………………

18. කෘත්‍යවාදී ගැටුම් වර්ගීකරණය ආකාර 02කි. ඒවා නම් කරන්න.

i……………………………………………………………

ii………………………………………………………………

19. ගැටුම් සමථනයෙහිලා සංස්කෘතික සන්නිවේදන ප්‍රවේශය (Cultural Communication Approach) මගින් ගෙනඑන යෝජනාවන් 02ක් දක්වන්න.

i………………………………………………………………

ii………………………………………………………………

20. ගැටුම් සමථන ක්‍රියාවලිය තුළ පහත කාර්යයන් හා අදාළ වන ගැටුම් සමථන විධික්‍රමය නම් කරන්න.

i. ගැටුමේ ව්‍යාප්තිය පරිමාව හා තීව්‍රතාව සීමාකිරීම.................................................................

ii. ගැටුම විසින්ම ගැටුමේ ගතිකත්වය හා අරමුණු අභිලාෂ වෙනස්කිරීමට ලක්වීම.............................................................................